**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - 2018**
**---------------------------------------------**

## 1.1 මතය ප්‍රකාශනය

**------------------**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම මත, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවට මා හට මතයක් ප්‍රකාශ කළ නොහැකි විය.

## 1.2 ප්‍රකාශනය කළ මතය සඳහා පදනම

----------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ප්‍රකාශනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

--------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ආයතනය විසින් පවත්වනු ලබන වැඩමුළු හා වැඩසටහන් ගිණුම් තැබීම සඳහා භාවිතා කරන ප්‍රධාන මූලාශ්‍ර ලියවිල්ල වන ඉන්වොයිසි අනුක්‍රමික අංක පිළිවෙලට සකස් කර නොතිබුණු අවස්ථා බොහොමයක් විගණනයේදී නිරීක්ෂණය වූ බැවින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පරිගණකගත ගිණුම්කරණ පැකේජයට ඇතුලත් කර තිබූ රු. 42,757,709 ක ආදායම්වල නිවරදාතාව පිළිබඳ සාධාරණ තහවුරුවක් විගණනයේදී ලබාගත නොහැකි විය. | 2019 වර්ෂයේ සිට ආයතනය තුල පවතින අංශ මගින් පවත්වන පාඨමාලා සඳහා ඉන්වොයිස් නිකුත් කිරීම, ගිණුම් අංශයේ ගිණුම්කරණ පැකේජය (Quick Book) මගින් පමණක් සිදු කරමි. කෙසේ වුවද රු. 42,757,709 ක ආදායම නිවැරදිව තහවුරු කරගත හැකි අතර ඊට අදාල ලියවිලි විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | ගිණුම්කරණ ක්‍රියාවලිය යාවත්කාලීනව හා නිවැරදිව පවත්වා ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදී ඒවා ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) ආයතනයේ පරිගණකගත ගිණුම්කරණ පද්ධතියට (Accounting Software) ඇතුළත් කළ දත්ත වෙනස් කිරීම හා මකා දැමීම වගකිවයුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයට හා අනුමැතිය යටතේ සිදු කර නොතිබුණි. එසේම, ගිණුම්කරණ පද්ධතියේ ආරක්ෂාව පිණිස මුරපද යොදා ප්‍රවේශය (Limited Access / Full Access) සීමා නොකිරීම, මූලාශ්‍ර ලියවිලි පදනම් කරගෙන (Invoices) ගිණුම්කරණ පද්ධතියට ආදායම් පිළිබඳ දත්ත ඇතුලත් නොකිරීම යනාදී අභ්‍යන්තර පාලන අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය වූ අතර, සමලෝචිත වර්ෂයේදී ගිණුම්කරණ පද්ධතියෙන් මකාදමා තිබූ රු.1,523,510 ක් වටිනා ගනුදෙනු 22 ක් පිළිබඳ ඉහළ කළමනාකාරීත්වය දැනුවත් වී නොතිබුණි. | Quick Book ගිණුම්කරණ මෘදුකාංගය සඳහා දත්ත ඇතුලත් කිරීම ගණකාධිකාරීවරිය තනිවම සිදු නොකරන අතර ගණුදෙනු ඇතුලත් කිරීම නිලධාරීන් තුන් දෙනෙකු මගින් සිදුකරනු ඇත. ගණකාධිකාරීවරිය විසින් පද්ධතිය අධීක්ෂණය කිරීම හා වැරදි ඇති තැන් සොයාබලා අවශ්‍ය වෙනස් කිරීම් සිදුකරනු ඇත. දත්ත ඇතුලත් කිරීමේදී සිදුවන සාමාන්‍ය වැරදි නිවැරදි කිරීමට ගණකාධිකාරීවරයාට බලය ඇත. 2019 වර්ෂයේදී Quick Book ගිණුම්කරණ මෘදුකාංගය සමඟ කරන ගිණුම්කරණ කටයුතුවලදී එක් එක් නිලධාරීන් සඳහා අදාල කටයුතු ඉටු කිරීමට පමණක් වෙනම මුරපද මගින් ප්‍රවේශ සීමා කිරීම සිදු කොට ඇත. | ගිණුම්කරණ පද්ධතියේ ආරක්ෂාව සහ විශ්වාසවන්ත භාවයද තොරතුරුවල නිවැරදිතාවයද තහවුරු කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේද ස්ථාපිත කිරීමට කළමනාකරණය කටයුතු කලයුතු වීම. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02** | | |
| ප්‍රමිතය අනුව ස්ථාවර තැන්පතු පොළී ආදායම වූ රු.1,668,064 ක මුදල මුදල් ගලා ඒමක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පෙන්නුම් කළ යුතු වුවත් ආයතනයෙන් මුදල් ගලායාමක් ලෙස දක්වා තිබුණි. | ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද, ස්ථාවර තැන්පතු පොළී ආදායම වර්ෂයේ අතිරික්තයට ගලපා ඇති බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගලා ඒමක් ලෙස ගැලපීම් සිදුකර නොමැත. | ආයතනය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුවීම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු 2018 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතු ශේෂය රු.23,739,447 ක් වුවද, ස්ථාවර තැන්පතු නැවත අළුත් කිරීමේ සහතික පත්‍රයේ සඳහන් ස්ථාවර තැන්පතු ශේෂය රු.22,041,444 ක් වූයෙන් එම ශේෂ අතර රු.1,698,003 ක වෙනසක් නිරූපණය විය. | ස්ථාවර තැන්පතු ශේෂය නිවැරදිව ගණනය කර ඇති අතර 2018.12.31 දිනට ශේෂය රු. 23,739,447 වන බව තහවුරු කරමි. | මූල්‍ය ප්‍රකාශන භාවිතා කර ආර්ථික තීරණ ගන්නා පාර්ශවයන්ට නිවැරදි තොරතුරු සැපයෙන පරිදි ගිණුම්කරණ සටහන් නිවැරදිව පවත්වා ගැනීමට ආයතනය කටයුතු කල යුතු වීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් පවත්වනු ලබන විවිධ වැඩසටහන්/ වැඩමුළු හා විභාග වෙනුවෙන් ලැබිය යුතු මුදල් 2017 වර්ෂයට රු.12,822,429 ක් වූ අතර 2018 දෙසැම්බර් 31 දිනට රු.15,320,597 ක් විය. ඉන් දින 90 ට වැඩි ලැබිය යුතු ශේෂය රු.6,824,450 ක් විය | 2018.12.31 දිනට ලැබිය යුතු රු. 15,320,597 ක මුදලින් 2019.03.31 වන විට ආයතනයට ලැබී ඇති මුළු මුදල රු. 11,412,045 කි. එය ලැබිය යුතු මුළු මුදලෙහි ප්‍රතිශතයක් ලෙස ගත්විට සියයට 75 ක් පමණි. | ආයතනයට ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුවිය යුතු අතර ඒ පිළිබඳ කාර්යක්ෂම හා ඵලදායී උපක්‍රම සංවර්ධනය කල යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 175(1) | ආයතනය විවිධ පාඨමාලාවලින් මුදල් එකතු කර ගැනීමේ ප්‍රගතිය පෙන්නුම් කරන පරිදි පාලන ගිණුමක ස්වරූපයෙන් වාර්තා සටහනක් තබාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | ආයතනය විසින් පවත්වන පාඨමාලා සඳහා සහභාගීවන්නන්ගෙන් ලැබිය යුතු මුදල් සහ අයවිය යුතු මුදල් සම්බන්ධව ඉදිරියේදී පාලන ගිණුමක් මගින් කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | ආයතනයේ ආදායම් එකතු කිරීම සඳහා සුදුසු පාලන ක්‍රමවේද හඳුන්වාදීම කළමනාකරණයේ වගකීමක් වීම. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 ඡේද හා 3 ඡේද | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ආයතනය පිළියෙල කර නොතිබුණු අතර එම චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩල නිපුණතා අවශ්‍යතාවයන් හඳුනාගෙන නොතිබුණි. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමට උපදෙස් ලබාදී ඇත. | කාර්ය මණ්ඩල නිපුණතා හඳුනාගෙන ඒ අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 8,573,023 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.5,149,301 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 3,423,722ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයතනයේ මෙහෙයුම් ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.13,121,903 කින් ඉහළ යෑම සහ භාණ්ඩාගාර පුනරාවර්තන ප්‍රදාන රු.524,686 කින් වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලසුමට අනුව, ආයතනයට ඡායා පිටපත් යන්ත්‍ර 2 ක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 2 ක ඇස්තමේන්තුවක් සකස් කර තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.1 (ආ) අනුව ප්‍රසම්පාදන කටයුත්ත ආරම්භයට පෙර තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර නොතිබුණි. එම කමිටුව විසින් මෙවැනි තාක්ෂණික භාණ්ඩ මිලදී ගැනීමේ පිරිවිතර සමාලෝචනය කල යුතු වුවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.3.1 (ඇ) අනුව එම සමාලෝචනය සිදුකර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සඳහා විගණන කරුණු පිළිබඳ අවධානය යොමුකරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති නිශ්චිත උපදෙස් හා මග පෙන්වීම්වලට අනුකූලව කටයුතු කල යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් ඩිප්ලෝමා පාඨමාලා පැවැත්වීම තුළින් 2018 වර්ෂයේදී රු.7,150,000 ක ආදායමක් උපයා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණද, පාඨමාලා 04 ක් පමණක් පැවැත්වීම තුළින් ලබාගෙන තිබුණු ආදායම රු.5,100,000 ක් පමණක් විය. එසේම, ආයතනය විසින් 2018 වර්ෂය තුලදී දෙදින වැඩසටහන් 63 ක් පැවැත්වීම තුළින් සඳහා රු. 5,670,000 ක ආදායමක් උපයා ගැනීමට සැලසුම් කළද, සත්‍ය ලෙස වැඩසටහන් 39 ක් පමණක් පවත්වා රු. 3,600,000 ක ආදායමක් උපයා තිබුණි. තවද, 2018 වර්ෂය තුලදී එක්දින වැඩසටහන් 66 ක් පැවැත්වීම තුළින් රු.2,970,000 ක ආදායමක් ලබා ගැනීමට සැලසුම් කලද තථ්‍ය ලෙස උපයා තිබුණු ආදායම රු.2,580,000 ක් පමණක් විය. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2018 වර්ෂයේදී රු. 7,150,000 ඇස්තමේන්තු ආදායමක්, ඩිප්ලෝමා 06 ක් පවත්වා ලබා ගැනීමට සැලසුම් කර තිබූ අතර ඩිප්ලෝමා 4 ක් පැවැත්වීමෙන් රු. 5,100,000 ක ආදායමක් ලබා ගැනීමට සමත් වී ඇත.<br>ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2018 වර්ෂය තුල දෙදින වැඩසටහන් 63 ක් පවත්වා රු. 5,670,000 ක ආදායමක් ලබා ගැනීමට සැලසුම් කර ඇති අතර පාඨමාලා 39 ක් පමණක් පැවැත්වීමෙන් රු. 3,600,000 ක් ඉපයීමට සමත්ව ඇත.<br>ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2018 වර්ෂය තුල එක්දින වැඩසටහන් 66 ක් පවත්වා රු. 2,970,000 ක ආදායමක් ලබා ගැනීමට සැලසුම් කර ඇති අතර පාඨමාලා 43 ක් පමණක් පැවැත්වීමෙන් රු. 2,580,000 ඉපයීමට සමත්ව ඇත. | සැලසුම්කරන ලද වැඩසටහන් ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක කිරීමට ආයතනය හැකි සෑම උත්සාහයක්ම ගතයුතු අතර ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කන් ලබා කර ගැනීමටද කටයුතු කල යුතුවීම. |